KADUWELA MUNICIPAL COUNCIL

INVITATION FOR BIDS

PROCUREMENT OF VEHICLES AND MACHINERIES - 2026

National Competitive Bidding

1. The Chairman, Municipal Procurement Committee, on behalf of the Kaduwela Municipal Council, invites sealed bids from eligible and qualified bidders for the supply of the following brand new vehicles and plant. Each contract will be evaluated and awarded separately.

Contract No.	Description	Qty	Bid document fee (Rs.)	Bid security (Rs.)	Delivery (weeks)
KMC/0 3/04(iii)/TW/01/2026	Three Wheeler (Petrol)	03	2,500	100,000	06
KMC/0 3/04(iii)/EXC/02/2026	Hydraulic Excavator, 60–70 class	01	5,000	350,000	12
KMC/0 3/04(iii)/CMP8/03/2026	Compactor Garbage Truck, 8 m³ body	01	7,500	375,000	12
KMC/03/04(iii)/CMP18/04/2026	Compactor Garbage Truck, 18 m³ body	03	10,000	1,250,000	16
KMC/0 3/04(iii)/BHL/05/2026	Backhoe Loader	01	7,500	425,000	12
KMC/0 3/04(iii)//TIP/06/2026	Tipper Truck, 2 cubes (5.66 m³)	01	5,000	170,000	10

Bids will be closed at 2.30 p.m. on 11 November 2026 and will be opened immediately after the closing of bids.

2. Bidding will be conducted under the National Competitive Bidding (NCB) procedure in accordance with the Procurement Guidelines – 2024 on Goods, Works and Non-Consulting Services. Foreign bidders are not eligible and a margin of preference for domestic goods will not be applied.

3. A bidder may bid for one or more of the above contracts. A separate bid document must be purchased, and a separate bid and a separate bid security submitted, for each contract bid for.

4. Qualification requirements include: a valid Manufacturer's Authorization for the make and model offered; documentary evidence of having supplied goods of the same type within the last three (03) years, with three (03) customer references; an authorised service point within thirty (30) kilometres of the Council premises, capable of servicing the type of unit offered; valid Business Registration and VAT Registration; and audited or certified financial statements for the last two (02) financial years. Further details are given in the Bidding Document.

5. Bidding Documents may be inspected free of charge, and purchased, at the Municipal Finance Department, Kaduwela Municipal Council, New Kandy Road, Kaduwela, from 9.00 a.m. to 3.00 p.m. on working days from 21 October 2026 to 10 November 2026, both dates inclusive, on submission of a written application and payment of the non-refundable fee shown above in cash at the Council's cash counter.

6. Requests for clarification shall be made in writing to the Chairman, Municipal Procurement Committee, and shall be received not later than 02 November 2026. A pre-bid meeting will be held at 9.00 a.m. on 02 November 2026 at the Robert Gunawardhana Main Hall, Kaduwela Municipal Council, New Kandy Road, Kaduwela. Attendance is not compulsory and non-attendance shall not be a ground for disqualification. Minutes of the meeting, with the questions raised and the responses given, will be furnished to every bidder who has purchased a Bidding Document. Any resulting change to the Bidding Documents will be made only by an addendum, and not through the minutes.

7. Bids shall be prepared in duplicate, marked "ORIGINAL" and "COPY", enclosed in separate sealed inner envelopes placed within one sealed outer envelope bearing the relevant contract number, addressed to the Chairman, Municipal Procurement Committee, and deposited in the Tender Box at the Municipal Finance Department, Kaduwela Municipal Council, New Kandy Road, Kaduwela, so as to be received at or before 2.30 p.m. on 11 November 2026. Late bids will be rejected and returned unopened.

8. Bids will be opened immediately after the closing of bids, at 2.30 p.m. on 11 November 2026, at the Office of the Municipal Commissioner, Kaduwela Municipal Council, in the presence of the bidders or their authorised representatives who choose to attend.

9. Each bid shall be accompanied by a bid security of the amount shown above, in the form of an unconditional bank guarantee, bank draft or letter of credit issued by a licensed commercial bank operating in Sri Lanka, or a refundable cash deposit paid to the Council, valid up to and including 09 March 2027. Bids shall remain valid until 09 February 2027.

10. The Kaduwela Municipal Council reserves the right to accept or reject any bid, and to annul the bidding process and reject all bids at any time prior to contract award, without thereby incurring any liability to bidders.

11. Further information may be obtained from the Municipal Engineer, Kaduwela Municipal Council, New Kandy Road, Kaduwela.

    Telephone: 011-2571200 / 077-6508752

    E-mail: mckaduwela@gmail.com / kadumceng@gmail.com

Chairman,
Municipal Procurement Committee,
Kaduwela Municipal Council,
New Kandy Road, Kaduwela.
21 October 2026

කඩුවෙල මහ නගර සභාව

ලංසු ඉදිරිපත් කිරීමේ ආරාධනාව

වාහන හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම – 2026

ජාතික තරඟකාරී ලංසු කැඳවීම

1. කඩුවෙල මහ නගර සභාව වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින්, පහත සඳහන් නවතම තත්ත්වයේ වාහන හා යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. එක් එක් වාහන හා යන්ත්‍රෝපකරණ වෙන වෙනම ඇගයීමට ලක් කර ප්‍රදානය කරනු ලැබේ.

කොන්ත්‍රාත් අංකය	විස්තරය	ප්‍රමාණය	ලංසු පත්‍රිකා ගාස්තුව (රු.)	ලංසු ඇපකරය (රු.)	භාරදීම (සති)
KMC/0 3/04(iii)/TW/01/2026	ත්‍රිරෝද රථ (පෙට්‍රල්)	03	2,500	100,000	06
KMC/0 3/04(iii)/EXC/02/2026	එක්ස්කැවේටර් යන්ත්‍රය (60–70)	01	5,000	350,000	12
KMC/0 3/04(iii)/CMP8/03/2026	ඝන මීටර් 8 කම්පැක්ටර් රථය (කසළ ට්‍රක්)	01	7,500	375,000	12
KMC/03/04(iii)/CMP18/04/2026	ඝන මීටර් 18 කම්පැක්ටර් රථය (කසළ ට්‍රක්)	03	10,000	1,250,000	16
KMC/0 3/04(iii)/BHL/05/2026	බැකෝ ලෝඩර්	01	7,500	425,000	12
KMC/0 3/04(iii)//TIP/06/2026	ඝන මීටර් 2 ටිපර් රථය (ස.මී. 5 – 5.5)	01	5,000	170,000	10

ලංසු 2026 නොවැම්බර් 11 දින ප.ව. 2.30 ට භාර ගැනීම අවසන් කෙරෙන අතර, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ.

2. මෙම ලංසු කැඳවීම, භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා වන 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ සිදු කෙරේ. විදේශීය ලංසුකරුවන්ට සහභාගී විය නොහැකි අතර, දේශීය භාණ්ඩ සඳහා මනාප ආන්තිකයක් අදාළ නොවේ.

3. ලංසුකරුවෙකුට ඉහත කොන්ත්‍රාත්තු එකකට හෝ කිහිපයකට ලංසු ඉදිරිපත් කළ හැකිය. ලංසු ඉදිරිපත් කරන එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා වෙන වෙනම ලංසු පත්‍රිකාවක් මිලදී ගෙන, වෙන වෙනම ලංසුවක් හා වෙන වෙනම ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

4. සුදුසුකම් අවශ්‍යතා: ඉදිරිපත් කරන වර්ගය හා ආකෘතිය සඳහා වලංගු නිෂ්පාදක බලය පැවරීමේ ලිපියක්; පසුගිය වසර තුන (03) තුළ එම වර්ගයේම වාහන හා යන්ත්‍රෝපකරණ සැපයූ බවට ලිඛිත සාක්ෂි හා ගනුදෙනුකරුවන් තිදෙනෙකුගේ (03) නිර්දේශ; මහා නගර සභා පරිශ්‍රයේ සිට කිලෝමීටර් තිහක් (30) ඇතුළත පිහිටි, අදාළ වර්ගයේ වාහන/යන්ත්‍ර සඳහා සේවා සැපයිය හැකි බලයලත් සේවා මධ්‍යස්ථානයක්; වලංගු ව්‍යාපාර ලියාපදිංචිය හා වැට් ලියාපදිංචිය; සහ පසුගිය මූල්‍ය වර්ෂ දෙක (02) සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන. වැඩිදුර විස්තර ලංසු පත්‍රිකාවේ දැක්වේ.

5. ලංසු පත්‍රිකා, 2026 ඔක්තෝබර් 21 දින සිට 2026 නොවැම්බර් 10 දින දක්වා (එම දින ද ඇතුළුව) වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා, කඩුවෙල මහා නගර සභාවේ මුදල් දෙපාර්තමේන්තුවේ දී නොමිලේ පරීක්ෂා කළ හැකි අතර, ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඉහත දැක්වෙන ආපසු නොගෙවන ගාස්තුව සභාවේ මුදල් කවුළුවට මුදලින් ගෙවා මිලදී ගත හැකිය.

6. පැහැදිලි කිරීම් අවශ්‍ය ලංසුකරුවන් විසින් 2026 නොවැම්බර් 02 දින හෝ ඊට පෙර ලැබෙන සේ, ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලිඛිතව ඉල්ලීම් යොමු කළ යුතුය. ලංසු පූර්ව රැස්වීම 2026 නොවැම්බර් 02 දින පෙ.ව. 9.00 ට කඩුවෙල මහ නගර සභාවේ රොබට් ගුණවර්ධන ප්‍රධාන ශාලාවේදී පැවැත්වේ. එම රැස්වීමට සහභාගී වීම අනිවාර්ය නොවන අතර, සහභාගී නොවීම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් නොවේ. රැස්වීමේ වාර්තාව, එහිදී ඉදිරිපත් කළ ප්‍රශ්න හා ලබා දුන් පිළිතුරු සමඟ, ලංසු පත්‍රිකා මිලදී ගත් සියලුම ලංසුකරුවන් වෙත ලබා දෙනු ලැබේ. ලංසු පත්‍රිකාවල යම් වෙනසක් කළ යුතු නම්, එය සිදු කරනු ලබන්නේ සංශෝධනයක් (addendum) මගින් පමණක් වන අතර, රැස්වීම් වාර්තාව මගින් නොවේ.

7. ලංසු, “මුල් පිටපත” හා “අනු පිටපත” ලෙස සලකුණු කර වෙන වෙනම මුද්‍රා තැබූ කවරවල බහා, අදාළ කොන්ත්‍රාත් අංකය සඳහන් කරන ලද එක් බාහිර මුද්‍රා තැබූ කවරයක් තුළ තබා, සභාපති, ප්‍රසම්පාදන කමිටුව යන ලිපිනය සඳහන් කර, 2026 නොවැම්බර් 11 දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර ලැබෙන සේ, කඩුවෙල මහ නගර සභාවේ මුදල් දෙපාර්තමේන්තුවේ තබා ඇති ලංසු පෙට්ටියට (Tender Box) බහාලිය යුතුය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කර නොවිවෘතව ආපසු එවනු ලැබේ.

8. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම, එනම් 2026 නොවැම්බර් 11 දින ප.ව. 2.30 ට, කඩුවෙල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කාර්යාලයේදී, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ විවෘත කරනු ලැබේ.

9. සෑම ලංසුවක්ම ඉහත වගුවේ දැක්වෙන ලංසු ඇපකරය සමඟ ඉදිරිපත් කළ යුතුය. එය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද කොන්දේසි විරහිත බැංකු ඇපකරයක්, බැංකු අණකරයක් හෝ ණයවර ලිපියක් විය යුතුය; නැතහොත් සභාවට ගෙවන ලද ආපසු ගෙවිය හැකි මුදල් තැන්පතුවක් විය යුතුය. එය 2027 මාර්තු 09 දින දක්වා (එම දිනය ද ඇතුළුව) වලංගු විය යුතුය. ලංසු 2027 පෙබරවාරි 09 දින දක්වා වලංගු විය යුතුය.

10. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ඕනෑම අවස්ථාවක ඕනෑම ලංසුවක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට, එසේම ලංසු කැඳවීමේ ක්‍රියාවලිය අවලංගු කර සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කඩුවෙල මහා නගර සභාව සතු වන්නේ ය.

11. වැඩිදුර තොරතුරු නාගරික ඉංජිනේරු, කඩුවෙල මහා නගර සභාව, නුවර පාර, කඩුවෙල යන ලිපිනයෙන් ලබා ගත හැකිය.

    දුරකථන: 011-2571200 / 077-6508752

    විද්‍යුත් තැපෑල: mckaduwela@gmail.com / kadumceng@gmail.com

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
කඩුවෙල මහ නගර සභාව,
නුවර පාර, කඩුවෙල.
2026 ඔක්තෝබර් 21